ශ්‍රී ලංකා පාපන්දු සම්මේලනය - 2024
-----------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

ශ්‍රී ලංකා පාපන්දු සම්මේලනයේ ("සම්මේලනය") 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීරණ ආදායම් ප්‍රකාශනය, අරමුදල් වෙනස් වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමග සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනත සහ 1993 අංක 47 දරන ක්‍රීඩා (සංශෝධන) පනතේ 9 වන වගන්තියෙන් සංශෝධිත 1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 21.අ වගන්තියේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.
මූල්‍ය ප්‍රකාශනවලින් 2024 දෙසැම්බර් 31 දිනට සම්මේලනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ **කුඩා හා මධ්‍ය පරිමාණ ආයතන සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට** (SLFRS for SMEs) අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම,මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන **කුඩා හා මධ්‍ය පරිමාණ අස්ථිත්වයන් සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට** අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සම්මේලනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සම්මේලනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සම්මේලනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සම්මේලනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1)වගන්තිය ප්‍රකාරව, සම්මේලනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදිම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ

අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සහ ඊට අදාළ විගණන සාක්ෂි ලබා ගැනීමට අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් ඉක්මවා යාම වැනි හේතු නිසා වන බැවිනි .

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සංගමයේ අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සම්මේලනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා සම්මේලනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. මාගේ නිගමනය පදනම් වී ඇත්තේ මාගේ විගණන වාර්තාවේ දිනය දක්වා ලබා ගත් විගණන සාක්ෂි මතය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත සම්මේලනයේ අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සම්මේලනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සම්මේලනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව සම්මේලනය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව සම්මේලනය කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීති රීති වලට අනුකූලව සම්මේලනය ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

### 1.5 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

#### 1.5.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණ | කළමණාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පිළිවෙලින් රු. 61,056,199 ක් සහ රු. 12,071,638 ක් වූ ලැබිය යුතු ශේෂයන්, අයකර ගැනීමකින් තොරව වසර 2 ත් 5 ත් අතර සහ වසර 05 කට වැඩි කාලයක් පුරා පවතී. තවද, මෙම ශේෂයන් අයකර ගැනීම සඳහා කිසිදු ඵලදායී පියවරක් ගෙන නොතිබුණි. | 2026 වර්ෂයේදී විධායක කමිටුවේ අනුමැතියට යටත්ව, අයකර ගත නොහැකි ශේෂයන් හඳුනාගෙන ඒවා සඳහා හානි පූර්ණ ප්‍රතිපාදන සැලසීමට මම එකඟ වෙමි. නිසැකවම අයකර ගත හැකි අරමුදල් ලබා ගැනීම සඳහා කටයුතු සූදානම් කර ඇත. | තවදුරටත් ප්‍රමාද කිරීමකින් තොරව, හිඟ මුදල් අයකර ගැනීමට සහ පියවීමට කඩිනම් පියවර ගත යුතුය. |

#### 1.5.2 අත්තිකාරම්

| විගණන නිරීක්ෂණ | කළමණාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පිළිවෙලින් රු. 591,484 ක් සහ රු.3,717,115 ක් වූ අත්තිකාරම් මුදල්, 2026 ජූනි 04 වන **දින වන විටත් පියවා නොතිබුණු** අතර වසර දහයකට වැඩි කාලයක් සහ වසර 2 ත් 4 ත් අතර කාලයක් පුරා පැවතුණි. | මීට අදාළව, රු. 591,484 ක සහ රු.1,000,000 ක මුදලක් පියවිය නොහැකි අතර, විධායක කමිටුවේ අනුමැතියට යටත්ව එම මුදල් ගිණුම්වලින් ඉවත් කිරීමට පියවර ගනු ඇත. ඉතිරි අත්තිකාරම් මුදල් ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු සූදානම් කර ඇත. | අත්තිකාරම් මුදල් පියවීම සඳහා කඩිනම් පියවර ගත යුතුය. |

### 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති,රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | කළමණාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ ) | 2017 අංක 24 දරන දේශීය ආදායම් **පනතේ** 02 වන **වගන්තිය** හා එම පනත සඳහා වන සංශෝධන | දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙතින් ආදායම් බදු ගෙවීමේ අරමුණ සඳහා සම්මේලනය ලියාපදිංචි වී නොතිබුණි. | මෙම කරුණ පිළිබඳව සොයා බලා ඉදිරියේදී සුදුසු පියවර ගැනීමට එකඟ වෙමි. | සම්මේලනය විසින් පනතේ ප්‍රතිපාදනවලට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ආ ) | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 39 වන වගන්තිය. | 2021, 2022 සහ 2023 වර්ෂ සඳහා නිකුත් කරන ලද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාවට අදාළව සම්මේලනය විසින් ගනු ලැබූ පිළියම්, ක්‍රියාමාර්ග 2026 ජූනි 04 වන දින දක්වාම විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | සම්මේලනය විසින් පනතේ ප්‍රතිපාදනවලට අනුකූලව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) 2024 මැයි 03 දිනැති අංක 2382/32 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් පළ කරන ලද, 2024 අංක 01 දරන ජාතික ක්‍රීඩා සංගම් නියෝගවල III වන කොටසේ 6 (xii) වන වගන්තිය | සම්මේලනය විසින් ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර නොතිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | ක්‍රීඩා රෙගුලාසි අනුගමනය කළ යුතු අතර ක්‍රියාකාරී සැලැස්මක් සකස් කළ යුතුය. |
| (ඇ) ක්‍රීඩා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද 2021 දෙසැම්බර් 15 දිනැති ජාතික ක්‍රීඩා සංගම්/සම්මේලනවල කටයුතු සම්බන්ධයෙන් වූ මාර්ගෝපදේශ සංග්‍රහය | | | |
| (i) 3 (iii) වන වගන්තිය | ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගෙන් අවශ්‍ය අනුමැතිය ලබා නොගෙන සම්මේලනය විසින් බැංකු ගිණුම් නවයක් (09) පවත්වාගෙන ගොස් තිබුණි. | මෙම කරුණ සම්බන්ධයෙන් පසුගිය වර්ෂවලදී ක්‍රීඩා සංවර්ධන අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත වාර්තා කර ඇත . | බැංකු ගිණුම් ආරම්භ කිරීමට පෙර අවශ්‍ය අනුමැතිය ලබා ගත යුතුය. |
| (ii) 3(xiv)වන වගන්තිය | 2024 දෙසැම්බර් 31 වන දින වන විට රු. 373,532,353ක් වටිනා ස්ථාවර වත්කම් සඳහා භෞතික සත්‍යාපනයක් සිදු කර නොතිබුණි. | 2026 වර්ෂයේදී වත්කම් සත්‍යාපනයක් සිදු කරනු ලැබේ. | වත්කම් සත්‍යාපනයන් වාර්ෂිකව සිදු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.51,022,471ක ඌණතාවයක් වූ අතර ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ ඌණතාවය රු.180,920,700 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.129,898,229 ක වර්ධනයක් නිරීක්ෂණය විය. පෙර වර්ෂයට සාපේක්ෂව මෙම වර්ධනයට ජාත්‍යන්තර පාපන්දු සම්මේලනය (FIFA) සහ ආසියානු පාපන්දු සම්මේලනය (AFC) වෙතින් ලැබුණු දායකත්ව මුදල් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂයේ ප්‍රධාන ආදායම් හා වියදම් විෂයන් ඉකුත් වර්ෂය සමඟ සසඳා විශ්ලේෂණය කර වැඩිවීම් හෝ අඩුවීම් වල ප්‍රතිශතයන් පහත දැක්වේ.

| ආදායම / වියදම විෂය | 2024 දෙසැම්බර් 31 දිනට අගය | 2023 දෙසැම්බර් 31 දිනට අගය | විචලනය | |
|---|---|---|---|---|
| | | | හිතකර / (අහිතකර ) | ප්‍රතිශතය |
| | රු . | රු . | රු. | % |
| **ආදායම්** | | | | |
| FIFA දායකත්වය | 353,937,002 | - | 353,937,002 | - |
| AFC දායකත්වය | 37,556,474 | - | 37,556,474 | - |
| මුල්‍ය සහ අනෙකුත් ආදායම් | 30,129,301 | 10,956,120 | 19,173,181 | 175 |
| **වියදම්** | | | | |
| පාපන්දු ආශ්‍රිත ක්‍රියාකාරකම්, සංවර්ධන හා තරඟ වියදම් | 356,482,259 | 72,743,225 | (283,739,034) | 390 |
| මෙහෙයුම් වියදම් | 110,756,371 | 95,286,425 | (15,469,946) | 16 |
| විදේශ විනිමය හුවමාරු අලාභය | 5,406,616 | 23,847,169 | 18,440,553 | 77 |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණය කරනු ලැබේ.

2023 ජනවාරි මාසයේදී FIFA විසින් සම්මේලනයට පනවා තිබූ අත්හිටුවීම, 2023 සැප්තැම්බර් 29 දින සිට ක්‍රියාත්මක වන පරිදි ඉවත් කිරීම හේතුවෙන්, සමාලෝචිත වර්ෂය තුළ FIFA සහ AFC වෙතින් ලැබුණු දායකත්ව මුදල රු. 391,493,476 කින් සැලකිය යුතු ලෙස ඉහළ ගොස් තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 හඳුනාගත් පාඩු

| විගණන නිරීක්ෂණ | කළමණාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2013 ජනවාරි 01 සිට 2017 ජුලි 31 දක්වා කාලය තුළ සිදු වූ මූල්‍ය වංචාවට අදාළව, හිටපු මුදල් කළමනාකරුගෙන් රු.48,388,399 ක මුදලක් අයකර ගැනීමට කිසිදු පියවරක් ගෙන නොතිබුණි. | මෙම මූල්‍ය වංචාව සම්බන්ධයෙන් HC-CRM 4563/2023 දරන නඩු අංකය යටතේ දැනටමත් මහාධිකරණය හමුවේ නඩුවක් විභාග වෙමින් පවතී. | අධිකරණ තීන්දුව ලැබීමෙන් පසු, සම්මේලනයට සිදු වූ අලාභය අයකර ගැනීමට පියවර ගත යුතුය. |

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණ | කළමණාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ ) | 2024 වර්ෂය සඳහා වූ ජාතික ක්‍රීඩා දින දර්ශනයට අනුව, දේශීය ක්‍රීඩා තරඟ නවයක් (09) පැවැත්වීමට සැලසුම් කර තිබුණි. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය තුළ කිසිදු දේශීය ක්‍රීඩා තරඟයක් පවත්වා නොතිබුණි. | 2023 වර්ෂයේදී නව විධායක කමිටුව පත් වීමෙන් පසු, ජාත්‍යන්තර තරඟාවලි පවත්වන ලද අතර 2025 වර්ෂය තුළ දේශීය තරඟාවලි පැවැත්වීමට සැලසුම් කර තිබුණි. | සම්මේලනය විසින් සැලසුම් කර ඇති පරිදි තරඟ පැවැත්විය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ ) | සම්මේලනයට අයත් ගොඩනැඟිල්ලේ ඉහළ මහලෙන් වර්ග අඩි 2,000 ක් පමණ, රු. 150,000 ක මාසික කුලියක් හෝ වර්ග අඩියකට මසකට රු. 75 බැගින්වූ කුළී පදනම මත 2026 ජනවාරි 01 දින දක්වා පෞද්ගලික සමාගමකට බදු දීම සඳහා 2014 ජනවාරි 09 වන දින ගිවිසුමකට එළඹ තිබුණි. කෙසේ වුවද, 2026 ජූනි 04 වන දින දක්වාම වර්ග අඩියක අනුපාතිකය තක්සේරු කර සාධාරණ පදනමක් මත කුලිය තීරණය කර නොතිබුණි. මෙහි ප්‍රතිඵලයක් ලෙස, සැලකිය යුතු ආදායම් ප්‍රමාණයක් සම්මේලනයට අහිමි වී තිබුණි. | තක්සේරු දෙපාර්තමේන්තුවේ උපදෙස් පරිදි නව ගිවිසුමක් සකස් කිරීමට එකඟ වෙමි. | සම්මේලනය විසින් සාධාරණ පදනමක් මත කුලිය තීරණය කළ යුතුය. |